**SAMODHANA JOURNAL**
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale

**2021** **Volume 10** **Issue I**

# පොලොන්නරු යුගයේ භාවිත චෝල කාසි සහ මස්ස කාසි අතර හඳුනාගත හැකි සම-අසමානතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න**[1]

Received Date: 15th June 2022
Accepted Date: 20th March 2023
Published Date: 06th June 2023

## Abstract

Numismatics, or the study of coins, is one of the important aspects of archaeology. This discipline provides extensive knowledge on the origin and evolution of coins, the minting of coins, metal technology and exchange value of coins, ancient economic background, and foreign influences of a particular period. *Massa* coins are one of the famous ones used in Sri Lanka during *Polonnaruwa* period. Sri Lankan kings produced these coins imitating *Chola* coins following their predecessor Chola kings. This research aims to identify the metal and physical differences between *Massa* and *Chola* coins. The research problem in this paper is to investigate whether there were any *Chola* influences on *Massa* coins during the *Polonnaruwa* period. In this research, two methods have been used for collecting data. They are library surveys and field visits. *Massa* coins preserved in Colombo and Kandy's national museums are observed as field visits. Different charts and photographs were used for the classification of the data. Comparative as well as descriptive methods are used to analyze the data. Finally, the research proved its hypothesis. According to the finding, there were *Chola* influences on *Massa* coins during the

[1] *පර්යේෂණ සහකාර, හිටපු තාවකාලික කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය* shehanthilakarathna1205@gmail.com

*Polonnaruwa* period. Furthermore, this study highlighted metal and physical similarities and differences between *Massa* and *Chola* coins. Found some differences and similarities of coin-made metal as well as symbols depicted on the coins and exchange value of the coins. It can be proven that the *Chola* rulers developed international trade during their regime in Sri Lanka. Successor Sri Lankan kings also wanted to keep international trade and foreign relations as it were during the *Chola* period. As a result, Sri Lankan rulers followed and imitated *Chola* coins when they produced them. According to the current research, the *Massa* coins have some metal and symbolic influences from the *Chola* coins.

**Keywords**: *Chola* coins, *Massa* Coins, *Polonnaruwa* Period, Similarities and Differences.

## හැඳින්වීම

වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම් ගත යුතු' බවට ඊ. එච්. කාර් පවසා ඇත. ඒ අනුව වර්තමානය තුළ ජීවත්වීමට අතීතය පිළිබඳ ව අවබෝධයක් පැවතීම අත්‍යවශ්‍ය වන බව පැහැදිලි වේ. ද්‍රව්‍යාත්මක සාධක ඇසුරින් අතීතය ප්‍රතිනිර්මාණය කිරීම පුරාවිද්‍යාවේ දී සිදු කරනු ලබයි. මෙහි දී පුරාවිද්‍යාඥයාට මූලාශ්‍රය පරිශීලනය කිරීමට සිදු වේ. මූලාශ්‍රය, සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක වශයෙන් ප්‍රධාන අංශ දෙකකට බෙදෙයි. කාසි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ගණයට අයත් වේ. කාසි පිළිබඳ අධ්‍යයනය කිරීම 'නාණක විද්‍යාව' (Numismatic) වශයෙන් හඳුන්වනු ලබයි. කාසිවල ප්‍රභවය හා විකාශනය, විවිධ කාසි මුද්‍රණය, ලෝහ තාක්ෂණය, කාසිවල විනිමය අගය යනාදිය පිළිබඳ ව නාණක විද්‍යාවේ දී අධ්‍යයනය කරනු ලබයි. ලෝහ කර්මාන්තය පිළිබඳ දැනුම, පැරණි තාක්ෂණය පිළිබඳ දැනුම, තත්කාලීන පැරණි යුගවල ආර්ථික තත්ත්වය පිළිබඳ අවබෝධය, කාල නිර්ණයන් සිදු කිරීමට පිටිවහල් ලැබීම යනාදි වශයෙන් දැනුම් සම්භරයක් සහ උපකාර රැසක් පුරාවිද්‍යාඥයාට නාණක විද්‍යාවෙන් සැපයේ. මීට අමතර ව කාසි නිර්මාණයට ලැබී ඇති විදේශීය ආභාස පිළිබඳ ව ද මෙහි දී හඳුනාගත හැකි ය. මේ අනුව කාසි පිළිබඳ අධ්‍යයනය පුරාවිද්‍යාව තුළ අතීතය ප්‍රතිනිර්මාණය කිරීමේ දී ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ භාවිත පැරණි කාසි වර්ග අතුරින් පොළොන්නරු යුගයේ දී නිකුත් කර තිබෙන මස්ස කාසි සුවිශේෂ වේ. මන්ද පොළොන්නරු යුගයේ පටන් දඹදෙණි යුගයේ පළමු වන බුවනෙකබාහු රජු දවස දක්වා ම අඛණ්ඩ භාවිතයක් මස්ස කාසිවලින් හඳුනාගත හැකි බැවිනි. මස්ස කාසි නිෂ්පාදනයට චෝල අභාසය ලැබී ඇති බවට නාණක විද්‍යාඥයෝ අදහස් කරති. මන්ද ක්‍රි. ව. 1017 සිට ක්‍රි. ව. 1070 දක්වා වූ වසර 53ක පමණ දීර්ඝ කාලයක් චෝලයන් විසින් මෙරට රජරට කලාපය පලනය කරන ලද බැවිනි. චෝලයන්ගෙන් රට මුදවා ගැනීමෙන් පසු ව ඔවුන්

ව්‍යවහාර කළ කාසි සම්පූර්ණයෙන් ම නිෂ්ප්‍රභ කිරීමට දේශීය පාලකයන් උත්සහ නොකළ බව, අවම වශයෙන් මෙරට පාලනය කළ රජවරුන් 11 දෙනෙකු වත් සොළී කාසි අනුගමනය කරමින් ස්වකීය නාමය යෙදීම පමණක් වෙනස්කමක් ලෙසට සිදු කොට මස්ස කාසි නිකුත් කර තිබීමෙන් පැහැදිලි වේ. මේ අනුව මෙම ලිපියෙහි අරමුණ වන්නේ මෙරට භාවිත චෝල කාසි සහ මස්ස කාසි අතර පවතින සම-අසමානතා පිළිබඳ ව හඳුනාගැනීමයි. ඒ හරහා මස්ස කාසි නිකුත් කිරීමට චෝල කාසිවල ආභාසය ලැබී තිබේ ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කෙරේ. එය මෙහි අධ්‍යයන ගැටලුව වේ. මෙරට පොලොන්නරු යුගයේ දී සංසරණය වී තිබෙන චෝල සහ මස්ස කාසි සංසන්දනාත්මක ව අධ්‍යයනය කොට මේ පිළිබඳ ව විශ්ලේෂණාත්මක ව කරුණු දැක්වීමක් මෙම ලිපිය තුළ සිදු කර ඇත.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාලය අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද භාවිත කෙරිණි. ඒ අනුව පුස්තකාල අධ්‍යයනය ඔස්සේ සාහිත්‍ය විමර්ශනයට අදාළ තොරතුරු එක්රැස් කරන ලදි. පුස්තකාලය පරිහරණය කොට නාණක විද්‍යාව සම්බන්ධයෙන් සිදු කර ඇති පූර්ව පර්යේෂණ, ගවේෂණ හා කැණීම් වාර්තා, පුවත්පත් ලිපි ආදිය පිළිබඳ ව විමර්ශනය කරන ලදි. සොළීන්ගේ දේශපාලන බල ව්‍යාප්තිය, ලංකාවේ විනිමය මාධ්‍යවල විකාසනය පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගැනීමට පුස්තකාල ගවේෂණය වැදගත් වේ. මෙහි දී මාතෘකාවට අදාළ බහුතරයක් සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු කෙරිණි. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ මෙහි දී සිදු කරනු ලැබුවේ කොළඹ සහ මහනුවර ජාතික කෞතුකාගාර දෙකෙහි ඇති චෝල සහ මස්ස කාසි අධ්‍යයනයට බඳුන් කිරීමයි. ඒ අනුව කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබෙන පොලොන්නරු යුගයේ සිටි පාලකයන් විසින් නිකුත් කරන ලද මස්ස කාසි 68ක් ද, 1/8 කාසි 11ක් ද, 1/16 කාසි 3ක් සහ පළමු වන රාජ රාජ රජුට අයත් කාසි 12ක් ද මහනුවර කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබෙන තිබෙන පොලොන්නරු යුගයේ සිටි පාලකයන් විසින් නිකුත් කරන ලද මස්ස කාසි 14ක් ද පළමු වන රාජ රාජ රජුට අයත් කාසි 2ක් ද වත්මන් පර්යේෂකයා විසින් අධ්‍යයනයට බඳුන් කරන ලදි. ඒ හරහා මෙම කාසිවල පවතින සම අසමානතා හඳුනාගන්නා ලදි. වගු, රූක් සටහන් සහ ඡායාරූප භාවිතයෙන් තොරතුරු වර්ගීකරණය කළ අතර විශ්ලේෂණාත්මක හා සංසන්දනාත්මක අධ්‍යයනනය මඟින් අර්ථකථන සිදු කෙරිණි.

## ප්‍රතිඵල

පොලොන්නරු යුගයේ සිටි පාලකයින් මස්ස කාසි නිකුත් කිරීමේ දී සොළී කාසිවල ආභාසය ලබා ගෙන තිබේ' යන්න මෙහි දී උපකල්පිතය ලෙස භාවිත කෙරිණි. කරුණු අධ්‍යයනයේ දී එම උපකල්පිතය සනාථ විය. බාහිර ලක්ෂණ මත පදනම් ව සොළී කාසි සහ මස්ස කාසි එකිනෙක සංසන්දනය කිරීමේ දී කාසි නිර්මිත මාධ්‍යය, කාසිවල ඇතුළත් සංකේත සහ වටිනාකම අනුව යම් යම් වෙනස්කම් ද සමානතා ද පවතින බවට හඳුනාගත හැකි විය. එම සැසඳීම මඟින් ද මස්ස කාසි නිකුත් කිරීමට සොළී කාසිවලින් පිටිවහලක් ලැබී තිබෙන බවට හඳුනාගත හැකි විය. 12 වන

සියවස වන විට ශ්‍රී ලංකාවේ කාසි සම්මත බරක්, හැඩයක් සහ නිශ්චිත වටිනාකමක් මෙන් ම නිකුත් කළ පාලක අනන්‍යතාව (පාලක නාමය) සහිත ව නිකුත් කිරීමේ සම්ප්‍රදාය ඇති වේ (බාලසූරිය, 2008, 7). මේ සඳහා වැඩි වශයෙන් බලපාන්නේ අන්තර්ජාතික වෙළෙඳාමයි. ක්‍රි. ව. 7 සහ 8 සියවස් වන විට ඉන්දියන් සාගර කලාපය කාර්යය බහුල වාණිජ කලාපයක් බවට පත් වේ. එහි ප්‍රධාන බලවේගය වී ඇත්තේ ආරාබි සහ චීන වෙළෙඳුන් ය (Imbulamure and others, 2016, 17). ලංකාවේ වාසිදායක භූගෝලීය පිහිටීම හේතුවෙන් රටේ වෙළෙඳාම් ප්‍රවාහය නැඟෙනහිර හා බටහිර ලෝකය අතර සබඳතාවක් ඇති කිරීමට මුල් විය. මේ නිසා දේශීය පාලකයාට ද කෘෂි ආර්ථිකයෙන් වෙළෙඳාම පදනම් කර ගත් ආර්ථිකයකට පරිවර්තනය වන්නට සිදු වූ බව පෙනේ. මේ සඳහා සොළී පාලනයෙන් ද දැඩි අනුබලයක් ලැබුණාට සැක නැත. මන්ද සොළීන් සාමුද්‍රික අධිරාජ්‍යයක් ගොඩනඟා ගැනීම හරහා අන්තර්ජාතික වෙළෙඳාමට නැඹුරු වූ පිරිසක් වන බැවිනි. අන්තර්ජාතික වෙළෙඳාමේ දී පිළිගත් විනිමය මාධ්‍යයක් අවශ්‍ය වූ බැවින් පොළොන්නරු පාලකයන් සොළී කාසි අනුගමනය කරමින් ස්වකීය කාසි නිකුත් කිරීමට පෙලඹෙන්නට ඇත. මේ අනුව මස්ස කාසි නිකුත් කිරීම කෙරෙහි චෝල කාසිවල ආභාසය ලැබී තිබෙන බවට පැහැදිලි ය.

## සාකච්ඡාව

ලංකාවේ ඓතිහාසික යුගය ආරම්භයේ සිට ම කාසි භාවිතයක් පැවති බවට මහාවංශය ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රය සාක්ෂ්‍ය දරයි. ප්‍රථම වරට නාමික ව කාසි වර්ගයක් පිළිබඳ ව සඳහන් වන්නේ මහාවංශයෙහි 21 වන පරිච්ඡේදයේ ය. ඒ එළාර රජුගේ රථය මිහින්තලේ මහ සෑයෙහි වැදීම නිසා වූ අලාභයට රජු කහාපණ 15000ක් ගෙවූ බවට සඳහන් වීමෙනි (මහාවංශය සිංහල, 2004, පරි. 21, 26 ගාථාව). මීට අමතර ව ක්‍රි. පූ. යුගයට අයත් සෙල්ලිපිවල ද කහාපණ, කහවණ, කශපණ ආදි නම් සඳහන් ව තිබේ. හස් එබූ කාසි, ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි, සිංහ සහ වෘෂභ කාසි, රන් කහවණුව යනාදිය පොළොන්නරු යුගයේ දී මස්ස කාසි නිකුත් කිරීමට පෙර ලංකාවේ භාවිත ව තිබෙන කාසි වර්ග වේ. මස්ස කාසිවල මෙන් දීර්ඝ කාලීන අඛණ්ඩ භාවිතයක් සහ සුලබ බවක් එකී කාසි වර්ගවලින් හඳුනාගත නොහැකි ය. රන් කහවණුවෙන් පසු ව මෙරට භාවිත වී තිබෙන්නේ සොළීන් විසින් නිකුත් කරන ලද කාසි ය. පල්ලවවරුන්ගෙන් පසුව දකුණු ඉන්දියාවේ බලයට පත් වන්නෝ චෝලයෝ ය. අපරාජිත නම් පල්ලව රජු පරාජය කොට විජයාලය නම් චෝල රජු දකුණු ඉන්දියාවේ බලවත් වේ. එහෙත් චෝලයන්ගේ දේශපාලනික බල වර්ධනයේ සහ ආර්ථික සමෘද්ධියෙහි උච්චතම අවස්ථාව සනිටුහන් වන්නේ 1 වන රාජ රාජ සහ රාජේන්ද්‍ර චෝල යන පාලකයන් යටතේ දී ය. දේශීය සහ විදේශීය වෙළෙඳාමේ ක්‍රියාකාරී තත්ත්වයක් මේ කාලයේ දී ඇති වේ. වෙළෙඳ කටයුතු නිසා ම වෙළෙඳ ඒකාධිකාරයක් ගොඩනඟා ගැනීමට විවිධ රටවල් සමඟ යුද ගැටුම්වල නිරත වීමට ද චෝලයන්ට සිදු වේ. දෙවන රාජ රාජ සමයේ දී චීනය සමඟ වෙළෙඳ සබඳතා වර්ධනය කර ගැනීමට යාම නිසා ඉන්දුනීසියාව, ශ්‍රී විජය, මාලදිවයින වැනි රටවල් සමඟ යුද්ධ කොට ඒවා යටත් කර ගැනීම නිදසුනකි. ලංකාව කෙරෙහි ද ඔවුන් ආක්‍රමණ දියත් කරන්නේ මේ තත්ත්වය නිසා ය. චොලයෝ සිය යටත් රාජ්‍යවල

ස්වකීය කාසි අච්චුගසා නිකුත් කළහ. ඉන්දියාවෙන් පරිබාහිර රටක් වශයෙන් චෝල අධිරාජ්‍යයේ කාසි බහුල ව හමුවන්නේ ලංකාවේ දී ය. සොළීහු ඒ වන විට මෙරට තුළ ප්‍රචාරය වී තිබූ රන්කහවණුව අනුගමනය කරමින් රන් හා තඹ කාසි නිකුත් කළහ (කල්දේරා, 1959, 18). එයින් පසු ව ආරම්භ වන්නේ දේශීය පාලකයන් විසින් සොළීන්ගේ කාසි අනුගමනය කරමින් අච්චු ගැසූ මස්ස කාසි භාවිතයයි. මුල් කාලයේ දී කහවණුවෙන් විස්සෙන් පංගුවක් වූ මස්ස පොලොන්නරු යුගයේ සහ පසු කාලයේ පොත්වල සඳහන් කර තිබෙන්නේ 'කහාපණ' යන්නට සමානාර්ථ පදයක් වශයෙනි (පරණවිතාන, 1972, 524). කෙසේ වුවත් 1 විජයබාහු රජු දවස පටන් 1 වන බුවනෙකබාහු රජු දවස දක්වා නිකුත් කර ඇති මස්ස කාසි "සිංහල මසු" නමින් ද " දඹදෙණි කාසි" නමින් ද හඳුන්වනු ලබයි. අවසන් වරට මේ කාසි අච්චු ගැසීම දඹදෙණි යුගයේ සිදු කළ නිසා 'දඹදෙණි කාසි' නමින් හැඳින්වේ (කල්දේරා, 1959, 18). කෙසේ වුවත් දඹදෙණි මස්ස හා සමාන ව සුළු සුළු වෙනස්කම් සහිත ව නිකුත් කළ කාසි පොලොන්නරු යුගයේ සිට කෝට්ටේ යුගයේ හය වන පරාක්‍රමබාහු රජු දවස දක්වා ම භාවිතයේ පැවත තිබේ (ගුණරත්න, 2019, 28). ඒ සඳහා මූල බීජ වී තිබෙන්නේ රන්කහවණුව අනුගමනය කරමින් සොළීන් විසින් නිකුත් කරන ලද කාසි සහ සොළීන් විසින් තත්කාලීන ව ගොඩනඟා තිබූ අන්තර්ජාතික වෙළෙඳාම පදනම් කර ගත් ආර්ථිකයයි.

**සොළී පාලන කාලයේ දී ලංකාව තුළ කාසි භාවිතය ප්‍රචලිත වීම**

මෙරට අනුරාධපුර යුගයේ රජ කළ අවසන් සිංහල පාලකයා වූ පස් වන මිහිඳු රජු චෝලයන්ගේ සිරකරුවෙකු බවට පත් වූ පසු මෙරට රජරට ප්‍රදේශය චෝල ප්‍රාන්ත රාජ්‍යයක් බවට පත් වේ. එතැන් සිට අනුරාධපුර රාජධානිය බිඳ වැටිණි. පොළොන්නරුව අගනගරය කොට ගත් සොළී ප්‍රතිරාජවරයෙකු යටතේ ලංකාව දකුණු ඉන්දියාවේ සොළී අධිරාජ්‍යයට නතු ව පාලනය විය. සොළීන්ගේ පරම අභිලාෂය වූයේ ඉන්දියන් සාගරයේ වෙළෙඳ ඒකාධිකාරය තමන් සතු කර ගැනීමට ය. රොමිලා තාපර් පවසන්නේ ශ්‍රී විජය, මාලදිවයින මෙන් ම ලංකාවේ උතුරුදිග ප්‍රදේශ ද සොළීන් තමන් සතු කොට ගත්තේ එකී අභිප්‍රාය සාධනය කර ගැනීමට බවයි (තාපර්, 2009, 194). මේ අනුව පැහැදිලි වන්නේ සොළීන්, තම අධිරාජ්‍යයේ ආර්ථික තත්ත්වය කෙරෙහි සහ ස්වකීය ආර්ථිකය ශක්තිමත් කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ පිරිසක් වන බවයි. සොළීන්ගේ දේශපාලන බල ව්‍යාප්තිය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ඔවුන් සාමුද්‍රික අධිරාජ්‍යයක් ගොඩනඟා ගත් බවට හඳුනාගත හැකි ය. එබැවින් ඔවුන්ට අන්තර්ජාතික වෙළෙඳාමට වැඩි නැඹුරුවක් දක්විය හැකි විය. මේ අනුව ඔවුහු සිය විනිමය මාධ්‍යයන් ද ඊට උචිත පරිදි සකසා ගත්හ. පළමු වන රාජ රාජ සහ රාජේන්ද්‍ර චෝල යන රජවරුන් විසින් සිය නාමය සහිත කාසි මෙරට දී නිකුත් කොට තිබේ (බාලසූරිය, 2008, 7). විශේෂයෙන් ම එම රජවරුන් විසින් නිකුත් කරන ලද රන් කාසිවලින් සොළී අධිරාජ්‍යයේ තත්කාලීන ව පැවති ආර්ථික සමෘද්ධිය විදහාපායි. මහා රාජ රාජ රජු යටතේ ලංකාවට ද රත්‍රං කාසි යුගයක් ඇරඹුණි. ඔහුගේ කාසි දකුණු ඉන්දියාවේ සොළී අධිරාජ්‍යයට සමකාලීන ව මෙරට තුළ ද ව්‍යවහාර වී තිබේ. මේ රජුගේ කාසි මෙරටින් සුලබ ව හමු වී ඇත (කුලතුංග, 2015, 623).

රන් කහවණුව, රන් මස්ස, රිදී මස්ස, තඹ මස්ස, රිදී ආලේපිත තඹ මස්ස, අඩ මස්ස, 1/4 මස්ස යනාදි වශයෙන් මෙරට තුළ පොලොන්නරු යුගයේ කාසිවල විකාසනය සහ ව්‍යවහාරය හඳුනාගත හැකි ය (ද සිල්වා, 2018, 40). පොලොන්නරු යුගයේ මුල් කාලය චෝල යුගයට අයත් වේ. ඒ අනුව ක්‍රි. ව. 1070 දක්වා චෝල පාලනය මෙරට තුළ ක්‍රියාත්මක විය. අනුරාධපුර යුගයේ පැවති රන් කහවණුව පාදක කර ගනිමින් සොළීන් පොලොන්නරු යුගයේ දී කාසි නිකුත් කළ බවට පෙනී යයි (ද සිල්වා, 2018, 40). මේ අවධියේ දී මෙරට ගනුදෙනු සඳහා නාගරී අක්ෂරයෙන් චෝල අධිරාජ්‍යයාගේ නම සඳහන් කළ කාසි සොළී පාලකයන් නිකුත් කර තිබේ. එලෙස අධිරාජ්‍යයාගේ නම සඳහන් කොට කාසි නිකුත් කිරීමේ අරමුණු කිහිපයක් තිබෙන්නට ඇත. තම යටත් වැසියන් අතර ස්වකීය අධිරාජයාගේ ආධිපත්‍යය වඩාත් හොඳින් මුල්බැස ගැන්වීම සහ සිය වෙළෙඳ කටයුතුවල දී හා බදු අයකර ගැනීමේ කටයුතුවල දී අත් වන පහසුව ප්‍රමුඛ වන්නට ඇත. තව ද ඒ වන විට ඉන්දියානු සාගර කලාපයේ පොදු භාෂාවක් වූ සංස්කෘත භාෂාවේ අක්ෂර සොළී කාසිවලට යොදා ගැනීමෙන් කාසි ව්‍යවහාර කළ විවිධ ජාතීන්ට මෙම කාසි කුමන පාලකයාට අයත් දැයි හඳුනා ගැනීමේ පහසුව ද සැලසෙන්නට ඇත. එමෙන් ම මේ වන විට පාලකයාගේ නම සඳහන් කොට කාසි නිකුත් කිරීම භාරතයේ ප්‍රචලිත ව තිබීම ද බලපාන්නට ඇත (කුලතුංග, 2015, 623). ලංකාවේ භාවිත ව ඇති සොළී කාසිවල ශ්‍රී රාජාධිරාජ, ශ්‍රී රාජ රාජ, ශ්‍රී රාජේන්ද්‍ර යන නම් දක්නට ලැබේ. මෙරට සොළී පාලන කාලය තුළ අයබදු අය කිරීමේ දී ඉන් කොටසක් මුදලින් ගෙවීමට නියම කර තිබේ. මුදලින් ගෙවීමට නියම කර ඇත්තේ "කාශු" නම් වූ සම්මත සොළී කාසිවලිනි (සිරිවීර, 2014, 79). සොළී පාලනය යටතේ වූ ලංකාවේ 'රාජරාජ වළනාඩු' හා 'වික්කිරම ශෝළ වළනාඩු' යන දිස්ත්‍රික්ක දෙකෙහි ආදායම්, ගම්වර පහක ආදායම තංජෝර් කෝවිලට දිය යුතු අතර එම ආදායමෙන් කොටසක් කාශුවලින් ගෙවිය යුතු බව තංජෝර් ශිලාලිපිවල සඳහන් ව තිබීම (නීලකණ්ඨ ශාස්ත්‍රි, 1972, 394) නිදසුනකි. මේ හේතුවෙන් සොළී පාලන කාලය තුළ දී ලංකාව තුළ කාසි භාවිතය වඩාත් ප්‍රචලිත වන්නට ඇත.

**සොළී පාලන කාලයෙන් පසු ව පොලොන්නරු යුගයේ දී කාසි නිකුත් කළ දේශීය පාලකයන්**

සොළීන්ගෙන් පසුව මහා විජයබාහු රජු රට එක්සේසත් කොට සොළී කාසිවලට සමාන ස්වරූපයෙන් කාසි නිකුත් කර තිබේ. මහා විජයබාහු රජු ද සිය අගනුවර වශයෙන් තෝරා ගත්තේ ද පොලොන්නරුවයි. ඒ අනුව ක්‍රි. ව. 1215 දී කාලිංග මාඝ ආක්‍රමණය එල්ල වන තෙක් ම අනුරාධපුරයෙන් පසු ව අගනගරය වශයෙන් පොලොන්නරුව පැවතියේ ය. මහා විජයබාහු රජුගෙන් පසු ව පොලොන්නරුවේ රජ වන මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල, ලීලාවතී, චෝඩගංගදේව, ධර්මාශෝකදේව, සහස්සමල්ල යනාදි පාලකයන් "මස්ස" කාසි නමින් හඳුන්වනු ලබන සොළී කාසි ස්වරූපයට කාසියේ අන්තර්ගත නම පමණක් වෙනස්කරමින් කාසි නිකුත් කොට තිබේ. එම "මස්ස" කාසිවල නිකුත් කළ පාලකයාගේ නම සඳහන් කොට තිබෙන්නේ නාමයට පූර්වයෙන් "ශ්‍රී" යන්න යොදා ගෙන ය (මැදගම, 2009, 61).

කාසි නිකුත් කිරීම පාලන ඒකාධිකාරය යටතේ සිදු වන්නකි. ඒ අනුව ආර්ථික කටයුතු පාලනයේ දී පැවති පාලන අධිකාරය පෙරළා නව පාලන අධිකාරයක් ස්ථාපිත වූ විට එකී නව පාලන අධිකාරය මඟින් කාසි නිකුත් කිරීම අත්‍යවශ්‍යය විය. ඒ අනුව අඩ සියවසක් පමණ කාලයක් රජරට පැවති සොළී පාලන අධිකාරය බලයෙන් පහ කළ මහා විජයබාහු රජු ස්වකීය නම සඳහන් කොට කාසි නිකුත් කොට තිබේ. සතුරන් පරදා ජාතියේ ස්වාධීනත්වය ඇති කිරීමෙන් පසු වත් පරාජිත සතුරාගේ නමින් නිකුත් කර තිබූ කාසි ගනුදෙනු සඳහා යොදා ගැනීම උදා කරගත් නිදහසට කැළලක් වන්නට ඇත. මහා විජයබාහු රජු මෙරට කාසියක නම සඳහන් කළ පළමු සිංහල රජු වශයෙන් පෙන්වා දිය හැකි ය (Sirisena, 2002, 14). මොහු විසින් රන්, රිදී සහ තඹ යන ලෝහ මාධ්‍යය තුනෙක් ම කාසි නිකුත් කරන ලදී (බාලසූරිය, 2008, 7). පොලොන්නරු යුගයේ දී රචිත යැයි සැලකෙන වෛජයන්ත පොතෙහි සඳහන් වන පරිදි රජෙකුගේ නමින් කාසියක් නිෂ්පාදනය වන්නේ ඔහුගේ ස්වර්ණාභිෂේකයේ දී ය. එසේ ම එම නාමයට ඉදිරියෙන් "ශ්‍රී" අක්ෂරය යෙදිය යුතු බවට එම කෘතියේ සඳහන් වේ. මේ අනුව මහා විජයබාහු රජු තම නම සඳහන් රන් කාසි නිකුත් කරන්නට ඇත්තේ ඔහුගේ අභිෂේකයේ දී බවට උපකල්පනය කළ හැකි ය (කුලතුංග, 2015, 625-626). මහා විජයබාහු රජුගේ කාසි බොහෝ සෙයින් සමාන වන්නේ රාජ රාජ රජුගේ කාසිවලට ය. එහි පිටුපස නාගරී අක්ෂරයෙන් "ශ්‍රී විජයබාහු" යනුවෙන් ලියා ඇත (Sirisena, 2002, 14). පොලොන්නරු යුගයේ දී අනුකාසි නිකුත් කිරීම ද සිදු කර තිබේ. ඒ අනුව භාග කාසියේ සිට 1/16 දක්වා කාසි අනුප්‍රභේද හමුව ඇත. පූර්ණ කාසියක බර ග්‍රේන්ස් 62-65 අතර අගයක් ගනියි (Codrington, 1924, 73). කෙසේ වුවත් මහා විජයබාහු රජු අඩසියවසක් පමණ කාලයක සිට වෙළෙඳ කටයුතුවල දී භාවිත කිරීමට ජනයා පුරුදු ව සිටි කාසිවල හැඩය හා ස්වරූපය වෙනස් කිරීමට පෙලඹී නැත. සුපුරුදු කාසියේ නමය පමණක් වෙනස් කිරීම ඔහු විසින් සිදු කෙරිණි. එහි දී දේවනාගරී අක්ෂර භාවිත කර ඇත්තේ ද අනුරාධපුර යුගයේ පටන් ම එම අක්ෂර භාවිතය ප්‍රචලිත ව පැවති නිසා වන්නට ඇත. එසේ ම ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනුවලට ද එය පිටිහලක් වන නිසා වන්නට ඇත. කෙසේ වුවත් විජයබාහු රජු ස්වකීය කාසි හඳුන්වා දීමේ දී ඒ වන විටත් භාවිතයේ පැවති සොළී කාසි මෙරට තුළ භාවිතයෙන් ඉවත් කළේ ද නැද්ද යන්න නිශ්චිත ව පැවසිය නොහැකි ය (කුලතුංග, 2015, 626).

මහා විජයබාහු රජුගෙන් පසු ව නැවතත් රට තුළ ඇති වූ ව්‍යාකූල දේශපාලන තත්ත්වය පහ කොට රට නැවතත් එක්සත් කරනු ලබන්නේ මහා පරාක්‍රමබාහු රජු විසිනි. මහා විජයබාහු රජුගේ කාසි සමග සැසඳීමේ දී මහා පරාක්‍රමබාහු රජුගේ කාසි ඒකරූපී බවක් උසුලයි. "ශ්‍රී පරාක්‍රමබාහු" යනුවෙන් ලියා මොහු විසින් කාසි නිකුත් කරන ලදී. ඒවායේ භාග කාසි ද හමු ව ඇත. මෙම රජු විසින් නිකුත් කර ඇති ඉතා කුඩා තඹ කාසි රන් කහවණුවේ අනුප්‍රභේදයක් වන අක කාසි වර්ගයට සමාන වේ. එකී කුඩා තඹ කාසිවල අක කාසිවල මෙන් අභිමුඛයෙහි සිට ගෙන සිටින නිධි රූපයක් ද ප්‍රතිමුඛයේ රූප රහිත ව පේළි තුනක් සිටින සේ නාගරී අක්ෂරයෙන් "ශ්‍රී පරාක්‍රමබාහු" යන පාඨය සටහන් කර තිබේ. අක්ෂරවලට ඉහළින් සංඛ සලකුණ ඇත. කොඩ්රිංටන් මහතා මෙය 1/8 කාසියක් බවට පවසයි. සාමාන්‍ය බර ග්‍රේන්ස්

8.5-7.6 දක්වා වේ (Codrington, 1924, 73). පරාක්‍රමබාහු රජුගේ කාසිවල හැඩය හා රූප සටහන් ඔහුට පෙර නිකුත් කර තිබෙන කාසි හා සමාන වේ. මහා පරාක්‍රමබාහු රජු ලංකාපුර සෙනෙවියා යොදවා පඬිරට ජය ගැනීමෙන් පසු ව තම නම සඳහන් කර්ෂාපණ එරට ව්‍යවහාරයේ යෙදවූ බව මහාවශයේ මෙසේ සඳහන් වේ.

"එ සියලු රට ම නිස්කණ්ටක කොට පරාක්‍රම මහීපාලයාගේ නාමාඞ්කිත කර්‍ෂාපණයන් ඒ රට සැම තන්හි ව්‍යවහාරයන්හි නියෝග කොට වීරපඬි කුමරහට ඒ රට ප්‍රතිපාදනය කොට...." (මහාවංශය, 2004, පරි. 77, 103-104 ගාථා).

ටී. ජී. කුලතුංග පවසන්නේ මෙම වංශකතාගත සඳහන මෙරට පැරණි පාලකයෙකු විසින් කාසි නිකුත් කළ බවට ඇති එක ම ලිඛිත සාධකය බවයි. ඒ අනුව උක්ත මහාවංශයෙහි විස්තරයේ සඳහන් කර ඇති පඬිරට ව්‍යවහාරයේ යෙදවූ කර්ෂාපණ යනු පරාක්‍රමබාහු රජුගේ නම සඳහන් මස්ස කාසි විය හැකි බවට අනුමාන කළ හැකි ය (කුලතුංග, 2015, 628).

මහා පරාක්‍රමබාහු රජුගෙන් පසු ව නැවත කාසි නිකුත් කිරීමක් සිදු ව තිබෙන්නේ නිශ්ශංකමල්ල රජු යටතේ ය. සොළී පාලක රාජ රාජ සිට මෙරට කාසි නිකුත් කළ සියලු ම පාලකයන් කාසියේ ප්‍රතිමුඛයෙහි සිය අභිෂේක නම සඳහන් කර තිබේ. එහෙත් නිශ්ශංකමල්ල රජු ඊට වෙනස් පිළිවෙතක් අනුගමනය කර ඇත. මෙම රජු ඊට පෙර කාසිවල ස්වරූපය එලෙෂ ම පවත්වා ගත්ත ද තම වංශය සම්බන්ධ කරමින් භාවිත කළ උපාධි නාමය අභිෂේක නම වෙනුවට කාසියෙහි සඳහන් කොට තිබේ. එනම් "ශ්‍රී කලිගලකෙජ" යනුවෙන් නිශ්ශංකමල්ල රජු සිය නාමය ඔහුට අයත් කාසිවල සඳහන් කොට තිබේ. මෙසේ අභිෂේක නාමය වෙනස් කිරීමට සමකාලීන දේශපාලන හේතු ඔහුට බලපාන්නට ඇත. කාලිංග වංශයට මෙරට රාජ්‍ය උරුමයට වැඩි අයිතියක් ඇති බව ජනතාවට ඒත්තු ගැන්වීමට ඔහු මෙලෙස උත්සහ කළ බවට සිතිය හැකි ය. ලීලානන්ද කල්දේරා පෙන්වා දෙන්නේ "ශ්‍රී කලිගලකෙජ" යනුවෙන් නම සඳහන් කර තිබීම විමතියට කරුණක් නොවන බවයි. මන්ද නිශ්ශංකමල්ල රජු ඔහුගේ සෙල්ලිපි බොහොමයක සිය නම දක්වා තිබෙන්නේ 'කාලිංග ලම්කේන්ද්‍ර' යනුවෙනි (කල්දේරා, 1959, 18). ඒ අනුව "ශ්‍රී කලිගලකෙජ" යන්නෙහි අර්ථය 'කාලිංග ලංකේන්ද්‍ර' බවට සිතිය හැකි ය. කෙසේ වුවත් මේ රජු විසින් කාසි වර්ග කිහිපයක් නිකුත් කර තිබේ. ඒවායින් සමරක් ඒවා රිදී කාසි ය (පරණවිතාන, 1972, 524). සෙනරත් පරණවිතාන පවසන්නේ නිශ්ශංකමල්ල රජුගේ තඹ කාසි සුලබ නොවීමෙන් පෙනීයන්නේ ධනයෙන් ප්‍රයෝජන ගැනීමට රට වැසියන්ට ඉඩ දෙන ලදැයි නිශ්ශංකමල්ල රජු කියන කියමන සැබෑවක් වන බවයි (පරණවිතාන, 1972, 525).

නිශ්ශංකමල්ලගෙන් පසු ව නැවතත් කාසි නිකුත් කර තිබෙන්නේ චෝඩගංගදේව රජු ය. නිශ්ක්මල්ලගෙන් පසු ව ඔහුගේ පුත්‍රයෙකු බවට සැලකෙන කාලිංග වංශික වීරබාහු රජ වුවත් ඊට පසු දින ම තාවුරු සෙනෙවියා විසින් ඔහු ඝාතනය කරන ලදී. ඉන් පසු ව රජ වන්නේ නිශ්ශංකමල්ලගේ බාල සොහොයුරා වශයෙන් සැලකෙන දෙවන වික්‍රමබාහු ය. නමුත් මාස තුනක් ගිය පසු ඔහු මරා චෝඩගංගදේව රාජත්වයට පත් වේ (වික්‍රමසිංහ, 1972, 491). ඔහු විසින් කාසි නිකුත් කර තිබෙන්නේ "ශ්‍රී

චොඩගඟදෙව" යන ස්වකීය අභිෂේක නාමය යටතේ ය. මොහුගේ කාසි ද හැඩය හා ස්වරූපය අතින් ඔහුට පූර්වයේ සිටි පාලකයන්ගේ කාසිවලට සමාන ය.

චෝඩගංගදේවගේ රාජ්‍ය කාලය මාස නවයකට සීමා කරමින් කිත්ති සෙනෙවියා විසින් මහා පරාක්‍රමබාහු රජුගේ අගබිසව වූ ලීලාවතී බිසව රාජත්වයට පත් කරනු ලබයි. වරින් වර අවස්ථා තුනක දී රජ වන මැයගේ පළමු වන රජ්‍ය කාලය ක්‍රි. ව. 1197 සිට ක්‍රි. ව. 1200 දක්වා වසර තුනකි. සෙසු රාජ්‍ය කාලයන් ක්‍රි. ව. 1209-1210 සහ ක්‍රි. ව. 1211-1212 ලෙසින් කෙටි කාලයන්ට සීමා විය. කෙසේ වුවත් තෙවරක් සිංහාසනයට පත් වූ එක ම පාලකයා වන බැවින් මෙරට ඉතිහාසය තුළ ලීලාවතී රැජින විසින් කැපී පෙනෙන වැදගත්කමක් හිමි කරගනු ලබයි (වික්‍රමසිංහ, 1972, 491). පෙර පාලකයන් පරිදි ම නාගරී අක්ෂරයෙන් "ශ්‍රී රාජලීලාවතී" යනුවෙන් ස්වකීය අභිෂේක නම සඳහන් කොට ඇය විසින් කාසි නිකුත් කර තිබේ. මෙය සිදු වන්නට ඇත්තේ ඇගේ පළමු රජ්‍ය කාලයේ දී විය යුතු ය. ලීලාවතී රැජිනගේ කාසිවල 'ශ්‍රී' අක්ෂරය සහ පුද්ගල නාමය අතරට 'රාජ' යනුවෙන් යෙදී තිබීම අනෙක් පාලකයන්ගේ කාසිවලින් වෙනස් වන ලක්ෂණයකි (කුලතුංග, 2015, 631).

වසර තුනක් වූ ලීලාවතී රැජිනගේ පළමු රජ්‍ය කාලය නිමා කරමින් කාලිංග පාක්ෂිකයෝ නිශ්ශංකමල්ල රජුගේ ඥාති සහෝදරයෙකු වූ සහස්සමල්ල රජ කරවූහ (වික්‍රමසිංහ, 1972, 491). ඔහු "ශ්‍රීමත් සහාසමල්ල" යනුවෙන් සඳහන් කොට කාසි නිකුත් කර තිබේ. මොහු ස්වකීය අභිෂේක නාමයට පෙර යෙදෙන 'ශ්‍රී' අක්ෂරය වෙනුවට 'ශ්‍රීමත්' යනුවෙන් යොදා ගැනීම පෙර පාලයන්ගේ කාසිවල දක්වෙන නාමය දක්වීමේ පොදු ලක්ෂණයෙන් වෙනස් වූ අවස්ථාවකි. මේ රජුගේ ඇතැම් කාසිවල "ශ්‍රීමත් සහාසමල" හෝ "ශ්‍රීම සහාසමල" යනුවෙන් ද සටහන් කොට තිබේ. මේ රජු විසින් නිකුත් කර තිබෙන 1/8 කාසි ද හමුව ඇත (Codrington, 1924, 73).

ඉන් පසු ව නිශ්ශංකමල්ල රජුගේ අගබිසව වූ කල්‍යාණවතී බිසව ආයස්මන්ත සෙනෙවියා විසින් රජ කරවා නැවත ඔහු විසින් ම ඇය බලයෙන් පහ කොට තෙමස් වයසැති ධර්මාශෝකදේව රජ කරවනු ලබයි. මේ බිළිඳු කුමරුට රජ්‍ය උරුමයට ඇති සම්බන්ධතාව මූලාශ්‍රයවලින් පැහැදිලි ව හඳුනාගත නොහැකි වුවත් කාලිංග වංශය හා සමීප ඥාතීත්වයක් තිබෙන්නට ඇත. රාජත්වයට පත් වන්නට ඇත්තේ එම කිට්ටු ඥාති සම්බන්ධතාව නිසා විය යුතු ය (වික්‍රමසිංහ, 1972, 493). මේ බිළිඳු රජු ද කාසි නිකුත් කර තිබේ. "ශ්‍රී ධම්මාශෝකදෙව" යන නම සඳහන් කාසි හමු වේ. එමෙන් ම මොහු ද මහා පරාක්‍රමබාහු රජු මෙන් කුඩා තඹ කාසි ද නිකුත් කර ඇත. ඒවායේ පරාක්‍රමබාහු රජුගේ කුඩා කාසිවල පරිද්දෙන් ම අභිමුඛයෙහි නිධි රුවත් ප්‍රතිමුඛයෙහි නාගරී අක්ෂරයෙන් බිළිඳු රජුගේ නාමයත් දක්වේ.

ඉන් පසු කාලයේ දී අනිකඞග, ලීලාවතී, ලෝකේශ්වර, ලීලාවතී, පරාක්‍රම පණ්ඩු ආදීහු පිළිවෙළින් පොලොන්නරුවේ රාජත්වයට පත් වෙති. එහෙත් ලීලාවතී රැජින හැර සෙසු පාලකයන් කාසි නිකුත් කළ බවට සාක්ෂ්‍ය නොමැත. ලීලාවතී රැජිනගේ කාසි ද ඇයගේ පළමු රජ්‍ය කාලයේ දී නිකුත් කරන්නට ඇති බවට විශ්වාස කෙරේ. ක්‍රි. ව. 1215 දී කාලිංග මාඝ රජරට බලය අල්ලා ගැනීමෙන් පසු ව දේශීය රජධානි නිරිතදිගට විතැන් වේ. දඹදෙණි රජධානියේ දෙවන පරාක්‍රමබාහු මාඝගෙන් රට

මුද්‍රාගෙන නැවතත් පොළොන්නරු යුගයේ භාවිත මස්ස කාසි පරිද්දෙන් ඔහුගේ නම යොදා කාසි නිකුත් කර තිබෙනු හඳුනාගත හැකි ය. අවසන් වරට මෙම කාසි නිකුත් කරන ලද්දේ දඹදෙණි යුගයේ පළමු වන බුවනෙකබාහු රජුගේ කාලයේ දී ය (දන්දුන්න, 2015, 18). මේ අනුව පොළොන්නරු යුගයෙන් ඇරඹි මස්ස කාසි දඹදෙණි යුගය දක්වා ම මෙරට සමාජය තුළ ව්‍යවහාර වූ බව පැහැදිලි ය. මෙම මස්ස කාසිවල භාග කාසි (අඩ මස්ස) ඇති වුවත් ඒවා විරල ය (දන්දුන්න, 2015, 18).

*වගු අංක 01- මස්ස කාසි නිකුත් කර ඇති පාලකයන් සිය නාමය කාසිවල සටහන් කර ඇති ආකාරය*

| නිකුත් කළ පාලකයා | පාලක නම දේව නාගරී අක්ෂරයෙන් | පාලක නම නූතන සිංහල අක්ෂරයෙන් |
|---|---|---|
| මහා විජයබාහු (ක්‍රි. ව. 1055-1110) |  | "ශ්‍රී විජයබාහු" |
| මහා පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) |  | "ශ්‍රී පරාක්‍රමබාහු" |
| නිශ්ශංකමල්ල (ක්‍රි. ව. 1187-1196) |  | "ශ්‍රී කලිගලකෙජ" |
| චෝඩගංග (ක්‍රි. ව. 1196-1197) |  | "ශ්‍රී චොඩගඟදෙව" |

| | | |
|---|---|---|
| ලීලාවතී<br>(ක්‍රි. ව. 1197-1200,<br>ක්‍රි. ව. 1209-1210,<br>ක්‍රි. ව. 1211-1212) |  | "ශ්‍රී රාජලීලාවතී" |
| සහස්සමල්ල<br>(ක්‍රි. ව. 1200-1202) |  | "ශ්‍රීමත් සහාසමල්ල" |
| ධර්මාශෝකදේව<br>(ක්‍රි. ව. 1208) |  | "ශ්‍රී ධම්මාශෝකදෙව" |

මූලාශ්‍රයඃ Imbulamure and others, 2016, 19.

**පොලොන්නරු යුගයේ භාවිත සොළී කාසි සහ මස්ස කාසි අතර පවතින සම-අසමානතා**

පොලොන්නරු යුගයේ දී නිකුත් කර තිබෙන සොළී කාසි සහ මස්ස කාසි පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීමෙන් අනතුරු ව මෙම කාසි දෙවර්ගය අතර පවතින සමානතා සහ අසමානතා පිළිබඳ ව කරුණු සාකච්ඡා කළ හැකි ය. පළමුවෙන් ම මෙම කාසි දෙවර්ගයෙහි ම පවතින සමානතා පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී හැඩය අනුව මේ කාසි දෙවර්ගය ම සමානත්වයක් දරනු ලබයි. පුරාණ ඉන්දියාවේ මෙන් ම ලංකාවේ ව්‍යවහාරිත කාසි පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී හැඩයෙන් වෙනස් වන කාසි නිකුත් කර තිබෙන අවස්ථා දෙරටේ ම ඉතිහාසය තුළින් හඳුනාගත හැකි ය. පුරාණ ඉන්දියාවේ භාවිත වූ හස් යෙදූ කාසි මෙන් ම ඇතැම් ඉන්දු-ග්‍රීක හා ශක පහ්ලව කාසි හැඩය අනුව වෙනස්කම් සහිත ඉන්දීය කාසිවලට නිදසුන් වේ. හස් යෙදූ කාසිවල නිශ්චිත හැඩයක් කිව නොහැකි ය. බ්‍රාහ්මී පාඨ සහිත ව ඇගතොක්ලීස් හා පැන්ටැලියන් විසින් නිකුත් කර ඇති හතරැස් තඹ කාසි, ගෙලෙහි සීනුවක් සහිත ඇත් හිසක් නිරූපිත මෙනැන්ඩර් රජුගේ හතරැස් තඹ කාසි, සීයුස් දෙවියා සහ " කවිශියෙ නගරදෙවතා" යන පාඨය දක්වෙන්නා වූ යුක්‍රැඩීස්ගේ හතරැස් තඹ කාසි යනාදිය වෘත්තාකාර හැඩයෙන් පරිබාහිර වූ ඉන්දු-ග්‍රීක කාසිවලට උදාහරණ වේ. අභිමුඛයේ රජු අශ්වාරෝහක ව සිටින මොආස්ගේ හතරැස් තඹ කාසි, අසිලිස්ගේ

හතරැස් තඹ කාසි ආදිය වෘත්තාකාර හැඩයෙන් පරිබාහිර වූ ශක පහ්ලව කාසිවලට උදාහරණ වේ. හස් යෙදූ කාසි, වෘෂභ කාසි, ලක්ෂ්මී කාසි ආදිය වෘත්තාකාර හැඩයෙන් වෙනස් ව ලංකාවේ භාවිත වී ඇති කාසිවලට උදාහරණ වේ. කාසියක් විනිමය මාධ්‍යයක් ලෙස වටිනාකමෙන් වැඩි වීමට ඊට නිශ්චිත හැඩයක් හා බරක් තිබීම අනිවාර්ය වේ. අන්තර්ජාතික වෙළෙඳාම් කටයුතුවල නිරත වීමේ දී මේ තත්ත්වය වඩාත් තීව්‍ර වේ. සොළීන් සාමුද්‍රික අධිරාජ්‍යයක් ගොඩනඟා ගනිමින් උත්සහ කළේ ඉන්දියන් සාගරයේ වෙළෙඳ ආධිපත්‍යය තමන්ට නතු කර ගැනීමට බව රොමිලා තාපර් පෙන්වා දෙයි (තාපර්, 2009, 194). මේ අනුව තමන්ට පූර්ව යුගවල සිට ඉන්දියාවේ භාවිත වූ කාසි නිෂ්පාදනය අනුව යමින් ස්වකීය වාණිජ පරමාර්ථ සාධනය කර ගනු වස් සොළීන් ද වෘත්තාකාර හැඩය තම කාසි අතර පවත්වා ගන්නට ඇත. සොළීන් මෙන් ම පොලොන්නරු යුගයේ කාසි නිකුත් කළ පාලකයෝ ද වෘත්තාකාර හැඩය එක ගනිමින් කාසි නිකුත් කිරීමට පෙලඹුණහ. මේ සඳහා ඇතැම් විට සොළී පාලනයෙන් ලැබුණු ආභාසය බලපාන්නට ඇත. අන්තර්ජාතික වෙළෙඳාමට නැඹුරුවීම සහ විදේශ සබඳතා පවත්වා ගැනීමට පෙලඹීම පොලොන්නරු යුගයේ දී වැඩි වශයෙන් හඳුනාගත හැකි ය. මේ නිසා ස්වකීය කාසි අන්තර්ජාතික පිළිගැනීමක් සහිත ව පවත්වා ගැනීමට වෘත්තාකාර හැඩය සම්මත හැඩය කොට ගෙන පොලොන්නරු පාලකයන් ද කාසි නිකුත් කරන්නට ඇත.

කාසි නිෂ්පාදිත මාධ්‍ය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ද චෝල සහ මස්ස කාසි අතර යම් සාම්‍යත්වයක් පෙනේ. මේ ලක්ෂණය පවතින්නේ පොලොන්නරු යුගයේ මුල් කාලයේ දී නිකුත් කර තිබෙන කාසිවල ය. රාජ රාජ සහ රාජේන්ද්‍ර චෝල ආදි සොළී රජවරු රන්, රිදී, තඹ යන ලෝහවලින් කාසි නිකුත් කර තිබේ. පොලොන්නරුව සොළීන්ගෙන් මුදා ගන්නා මහා විජයබාහු රජු ද රන්, රිදී, තඹ යන ලෝහවලින් කාසි නිකුත් කර ඇත (ද සිල්වා, 2018, 42). නිශ්ශංකමල්ල රජු විසින් ද රිදී, තඹ කාසි නිකුත් කර තිබේ. ඔහුගෙන් පසු පාලකයන් තඹ කාසි රැසක් නිකුත් කර ඇත (පරණවිතාන, 1972, 524). මහා පරාක්‍රමබාහු රජුගෙන් පශ්චාත්කාලීන ව වටිනා ලෝහයන්ගෙන් කාසි නිකුත් කිරීම නතර වන බැවින් 'කාසි නිර්මිත මාධ්‍යය' යන නිර්ණායකය පදනම් කොට ගෙන මස්ස කාසිවල සහ චෝල කාසිවල අසමානතාවක් ද හඳුනාගත හැකි ය.

සොළී කාසිවල සහ පොලොන්නරු යුගයේ නිකුත් කර ඇති මස්ස කාසිවල නිරූපිත සංකේත පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ඒවායෙහි ද සමානත්වයක් දැකගත හැකි ය. මෙම කාසි දෙවර්ගයෙහි ම අභිමුඛයේ දක්වෙන්නේ හිට ගෙන සිටින මානව රුවකි. එය රජෙකු හෝ දෙවියෙකු බවට විවිධ මතවාද ඉදිරිපත් ව තිබේ. මේ රුව දකුණු පසට හැරී හිටි ඉරියව්වෙන් සිටින්නේ නෙළුම් දඬුවක් වැනි යමක් මත ය. එම දණ්ඩේ අගට සම්බන්ධ වී වම් අතට පහළින් බිංදු පහක සලකුණක් දක්වේ. ටී. ජී. කුලතුංග එය මල් පොකුරක් බවට සිතිය හැකි නමුත් නිශ්චිත ව කුමක් දැයි හඳුනා ගැනීමට අපහසු බවට දක්වයි (කුලතුංග, 2015, 460). වම් අත නමා ගෙන එයින් යම් වස්තුවක් මුහුණට කොට අල්ලා ගෙන සිටියි. එසේ අල්ලා ගෙන සිටින්නේ හක් ගෙඩියක් හෝ පද්මයක් බවට විවිධ මතවාද පවතියි. දකුණු අතින් පහනක් වැනි යමක් අල්ලා ගෙන සිටියි. ප්‍රතිමුඛයෙහි දැක්වෙන්නේ අභිමුඛයෙහි දැක්වෙන හිට

ගෙන සිටින රුවේ හිඳි ඉරියව්වයි. ඉඳ ගෙන සිටින්නේ කොටු සලකුණකින් නිරූපිත දෙයක් මත ය. එම සලකුණ නිරූපණය කර තිබෙන්නේ වියන ලද ඇඳක හෝ ආසනයක් පරිද්දෙනි (කුලතුංග, 2015, 456). මෙම හිඳි ඉරියව්වෙන් යුත් මානව රුවේ උඩු කය හා යටි කය පැහැදිලි ව වෙන් කොට හඳුනාගත හැකි ය. මෙම හිඳි රුව දකුණු දෙසට හැරී දකුණු අත දකුණු දණහිස මත තබා ගෙන සිටියි. වම් අත නමා ගෙන මුහුණ දෙසට ළං කොට හක් ගෙඩියක් හෝ පද්මයක් අල්ලා ගෙන සිටියි. ප්‍රතිමුඛයෙහි නිරූපිත මානව රුවේ හිඳි ඉරියව්ව ලංකාවේ ඉසුරුමුණියේ ඇති මිනිසා සහ අශ්ව හිස කැටයමෙහි මිනිසා හිඳ ගෙන සිටින ඉරියව්වට සමාන බවක් පෙන්නුම් කරයි. අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ දැක්වෙන මෙම කේන්ද්‍රීය මානව රූපය නිරූපිත කර තිබෙන්නේ නොවැසූ උඩු කයකින් සහ යටි කයට දෝතියක් වැනි ඇඳුමක් ඇඳ ගෙන සිටින ආකාරයෙනි. දෙපසින් සහ මැදින් පහළට වැටී ඇති රේඛා සලකුණු නිරූපණය කර තිබෙන ආකාරයෙන් යටිකය ඇඳුම දෝතියක් විය හැකි බවට අනුමාන කෙරේ. මේ ආකාරයට සොළී කාසිවල සහ මස්ස කාසිවල නිරූපිත මෙම හිඳි සහ හිටි ඉරියව්වෙන් යුතු මානව රුව කාගේ ද යන්න පිළිබඳ ව විවිධ අදහස් පවතියි. මෙම පුද්ගල රූපය විෂ්ණුගේ අවතාරයක් වන රාමාගේ රූපය බවට කොඩ්රින්ටන් අදහස් කරයි (Codrington, 1924, 54). කාසිචෙට්ටි අදහස් කරන්නේ උඩු පැත්තේ විෂ්ණු රුවත් යට පැත්තේ හනුමන් රූපයත් නිරූපිත බවයි (කල්දේරා, 1959, 14). පරණවිතානගේ අදහස වන්නේ හිටි ඉරියව්වෙන් අභිමුඛයේ නිරූපිත වන්නේ ධනයට අධිපති කුවේර බවත්, හිඳි ඉරියව්වෙන් ප්‍රතිමුඛයෙහි නිරූපිත වන්නේ සංඛ, පද්ම නිධි රූප දෙකෙන් එකක් බවත් ය (කුලතුංග, 2015, 456). රිස් ඩේවිඩ්, සී. ඇම්. ප්‍රනාන්දු වැනි විද්වතුන් අදහස් කරන්නේ එම පුද්ගල රූපය රජ රුවක් වන බවයි (කුලතුංග, 2015, 456). සොළීන් වැඩි වශයෙන් ම නිකුත් කර තිබෙන්නේ ඉහත විස්තර කළ ආකාරයේ අභිමුඛයේ හිට ගෙනත්, ප්‍රතිමුඛයෙහි හිඳ ගෙනත් සිටින මානව රුව දැක්වෙන කාසි වුවත් චේර, චෝල හා පාණ්ඩ්‍ය යන දකුණු ඉන්දියාවේ බලවත් ව සිටි රාජධානිවල රාජ්‍ය ලාංඡන ඇතුළත් කාසි කිහිපයක් ද ඔවුන් විසින් නිකුත් කර තිබෙන බව මෙහි දී සඳහන් කළ යුතු ය.

රජුගේ නාමය සටහන් කිරීමට දේව නාගරී අක්ෂර යොදා ගෙන තිබීම ද සොළී කාසිවල සහ පොලොන්නරු යුගයේ නිකුත් කළ මස්ස කාසිවල පවතින තවත් සමානකමකි. සොළී කාසිවල ශ්‍රී රාජ රාජ, ශ්‍රී රජාධිරාජ, ශ්‍රී රාජේන්ද්‍ර යනුවෙන් රජුගේ නම දේව නාගරී අක්ෂරයෙන් සටහන් කොට තිබේ. ශ්‍රී විජයබාහු, ශ්‍රී පරාක්‍රමබාහු, ශ්‍රී කලිගලකෙජ, ශ්‍රී චොඩගඟදෙව, ශ්‍රී රාජලීලාවති, ශ්‍රීමත් සහාසමල්ල, ශ්‍රී ධම්මාශෝකදෙව යනුවෙන් පොලොන්නරු යුගයේ දී කාසි නිකුත් කළ පාලකයන් ස්වකීය නාමය දේව නාගරී අක්ෂරයෙන් සටහන් කර ඇත. මේ පිළිබඳ ව කුලතුංග මෙවැනි අදහසක් ඉදිරිපත් කරයි.

"එසේ ම ඉන්දියානු කලාපයේ පොදු භාෂාවක් වූ සංස්කෘත භාෂාවේ අක්ෂර යොදා ගැනීමෙන් කාසි භාවිතයේ යෙදුණු විවිධ ජාතීන්ට මෙම කාසි කුමන පාලකයින්ට අයත් කාසි දැයි හඳුනා ගැනීමේ පහසුව එයින් ලැබේ." (කුලතුංග, 2015, 623).

මෙම කාසි දෙවර්ගයේ දී ම රජවරු සිය නම සටහන් කිරීමේ දී "ශ්‍රී" අක්ෂරය මුලින් යොදා ගෙන තිබේ. එහි සුළු වෙනස්කමක් සහස්සමල්ල රජුගේ කාසිවල "ශ්‍රීමත්"

යනුවෙන් යෙදී තිබීම නිසා හඳුනාගත හැකි වුවත් පොලොන්නරු යුගයේ කාසි නිකුත් කර ඇති සෙසු පාලකයන් සය දෙනාගේ ම ද සොළී කාසිවල ද "ශ්‍රී" අක්ෂරය පාලක නාමයට පූර්වයෙන් යෙදී තිබේ. මෙරට පොලොන්නරු යුගයේ දී රචිත බවට සැලකෙන වෛජයන්ත පොතෙහි රජ කෙනෙකුගේ නමින් කාසි නිකුත් කරන්නේ ඔහුගේ ප්‍රථම අභිෂේකයේ දී බවත් එම නමට පූර්වයෙන් "ශ්‍රී" අක්ෂරය යෙදිය යුතු බවත් සඳහන් වේ (කුලතුංග, 2015, 625-626). මේ සඳහන අනුව කාසිවල පාලකයාගේ නමට පූර්වයෙන් "ශ්‍රී" අක්ෂරය යෙදීම ලංකාවේ දී කාසි නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුත්තකි. එහෙත් සොළී කාසිවලත් එම ලක්ෂණය හඳුනාගත හැකි ය. එබැවින් එම සඳහන තත්කාලීන ව දෙරටේ ම කාසි නිකුත් කිරීමේ දී අනුගමනය කළ පොදු පිළිගැනීමක් වන්නට ඇති බවට අනුමාන කළ හැකි ය.

සොළී කාසිවල මෙන් ම පොලොන්නරු යුගයේ මස්ස කාසිවල ද පාලකයාගේ නම සඳහන් කොට තිබෙන්නේ ප්‍රතිමුඛයෙහි හිඳි ඉරියව්වෙන් යුත් මානව රුවට ඉදිරියෙනි. එහි දී එම කේන්ද්‍රීය රුවට ඉදිරියෙන් පේළි දෙකකට හෝ තුනකට සිටින සේ පාලකයාගේ නාමය සටහන් කර තිබීම ද මෙම කාසි දෙවර්ගයෙහි පවතින සමානත්වයකි.

මීළඟට පොලොන්නරු යුගයේ භාවිත මස්ස කාසි සහ චෝල කාසි අතර පවතින අසමානතා පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. එහි දී කාසි නිර්මිත මාධ්‍යය යන්න පිළිබඳ ව පළමු ව කරුණු සාකච්ඡා කෙරේ. පොලොන්නරු යුගයේ මුල් කාලයේ දී නිකුත් කර තිබෙන කාසි පිළිබඳ ව අවධානය යොමු කළ විට කාසි නිර්මිත මාධ්‍යයන්ගේ සමානත්වයක් දැකගත හැකි ය. එනම් පළමු වන රාජ රාජ සහ රාජේන්ද්‍ර චෝල යන සොළී පාලකයන් මෙන් ම මහා විජයබාහු රජු ද රන්, රිදී, තඹ යන ලෝහ මාධ්‍ය ත්‍රයයෙන් ම කාසි නිකුත් කර තිබේ. එහෙත් විජයබාහු රජුගෙන් පසුකාලයේ දී මේ තත්ත්වයෙහි වෙනසක් පෙන්නුම් කෙරේ. සොළී පාලකයන් බහුල ව රන් කාසි නිකුත් කර ඇත. රිදී හා තඹ කාසි නිකුත් කර තිබුණ ද ඊට සාපේක්ෂ ව ඔවුන්ගේ රන් කාසි නිකුත් කිරීමේ ප්‍රවණතාව වැඩි ය. එහෙත් මස්ස කාසි බහුල ව නිකුත් කර තිබෙන්නේ තඹ ලෝහයෙනි. සෙනරත් පරණවිතාන පවසන්නේ වටිනා ලෝහ වර්ගවලින් කාසි සෑදීම පළමු වන පරාක්‍රමබාහු රජුගෙන් කෙළවර වූ බවයි (පරණවිතාන, 1972, 524). නිශ්ශංකමල්ල රජු විසින් රිදී කාසි සමහරක් නිකුත් කර තිබූවත් ඔහුගෙන් පශ්චාත්කාලීන පාලකයන් කාසි නිකුත් කර තිබෙන්නේ තඹ ලෝහයෙනි. පරණවිතාන පවසන්නේ විජයබාහු රජු රන් කාසි නිකුත් කළ ද ඒවා බාල රනින් සාදන ලද ඒවා හෝ රිදියෙන් සාදා රන් ආලේපිත කරන ලද ඒවා බවයි (පරණවිතාන, 1972, 524). පළමු වන පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල, චොඩගංග, සහස්සමල්ල, ධර්මාශෝකදේව යන රජවරුන් විසින් නිකුත් කරන ලද ඇතැම් කාසි තඹ මිශ්‍ර රිදී බවට හඳුනාගත හැකි ය (ද සිල්වා, 2018, 45). පළමු වන පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල, චොඩගංග, සහස්සමල්ල යනාදි පාලකයන් විසින් සුදු ලෝහයෙන් (White metal) නිෂ්පාදිත (ඇතැම් විට තඹ ඉතා කුඩා ප්‍රමාණයක් අඩංගු වේ) කාසි ද නිකුත් කර තිබේ (ද සිල්වා, 2018, 45). රිදී ආලේපිත කාසි නිකුත් කර තිබෙන පාලකයන් ලෙසට නිශ්ශංකමල්ල, චොඩගංග, ලීලාවතී, සහස්සමල්ල, ධර්මාශෝකදේව යන පාලකයන් හඳුනාගත හැකි ය (ද සිල්වා, 2018, 45). මේ අනුව

කාසි නිර්මිත මාධ්‍යය අනුව පොලොන්නරු යුගයේ භාවිත මස්ස සහ සොළී කාසි යන දෙවර්ගය අතර යම් අසමානතාවක් ද පවතින බවට හඳුනාගත හැකි ය.

*වගු අංක 02 - විවිධ ලෝහ මාධ්‍යයන් ගෙන් මස්ස කාසි නිකුත් කර ඇති පාලකයෝ*

| නිකුත් කළ පාලකයා | රන් කාසි | රිදී කාසි | තඹ කාසි | තඹ මිශ්‍ර රිදී කාසි | සුදු ලෝහ (ඇතැම් විට තඹ ඉතා කුඩා ප්‍රමාණයක් අඩංගු වේ) | රිදී ආලේපිත කාසි |
|---|---|---|---|---|---|---|
| මහා විජයබාහු (ක්‍රි. ව. 1055-1110) | ✓ | ✓ | ✓ | | | |
| මහා පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) | | ✓ | ✓ | ✓ | ✓ | |
| නිශ්ශංකමල්ල (ක්‍රි. ව. 1187-1196) | | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| චෝඩගංග (ක්‍රි. ව. 1196-1197) | | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ලීලාවතී (ක්‍රි. ව. 1197-1200, ක්‍රි. ව. 1209-1210, ක්‍රි. ව. 1211-1212) | | ✓ | ✓ | | | ✓ |
| සහස්සමල්ල (ක්‍රි. ව. 1200-1202) | | | ✓ | ✓ | ✓ | ✓ |
| ධර්මාශෝකදේව (ක්‍රි. ව. 1208) | | ✓ | ✓ | ✓ | | ✓ |

මූලාශ්‍රයඃ ද සිල්වා, 2018, 45.

පොලොන්නරු යුගයේ භාවිත මස්ස කාසිවල අනුප්‍රභේද හඳුනාගත හැකි ය. එහෙත් සොළී කාසිවල එවැනි අනුප්‍රභේද නොමැත. මස්ස කාසි 1/8 සහ 1/16 වශයෙන් අනුවර්ගවලට බෙදෙයි (ජයසිංහ, 2013, 58). මස්ස කාසිවල හඳුනාගත හැකි මේ විවිධතාව පිළිබඳ ව ලීලානන්ද කල්දේරා මෙසේ විස්තර කොට තිබේ.

"කහවණුවෙහි මෙන් මෙම කාසිවල ද විෂම භාග ඇති විය. එහෙත් සුලභ වශයෙන් නොවේ. මේ වර්ගයේ භාගයේ කාසි රජවරුන් කීප දෙනෙක් විසින් ම නිකුත් කර තිබෙන බව පෙනේ. 1 වන පරාක්‍රමබාහු රජුගේ හා ධර්මාශෝක දෙව රජුගේත් නම් සඳහන් වන මෙම වර්ගයේ 1/8 කාසි හා 1/16 කාසි කිහිපයක් ගැනද නොබෝදා දැන ගන්නට හැකි විය." (කල්දේරා, 1959, 18).

මස්ස කාසියෙන් භාගය වන අඩ මස්ස කාසි පළමු වන පරාක්‍රමබාහු, ලීලාවතී, සහස්සමල්ල යනාදි පාලකයන් නිකුත් කර ඇත (ද සිල්වා, 2018, 45). පළමු වන

පරාක්‍රමබාහු රජු විසින් මස්ස සහ අඩ මස්ස කාසිවලට අමතර ව 1/8 සහ 1/16 යන මස්ස කාසියේ තවත් අනුප්‍රභේද දෙකකින් කාසි නිකුත් කර තිබේ (ද සිල්වා, 2018, 45). මහා පරාක්‍රමබාහු රජු දවස ආර්ථික කටයුතු පුළුල් වශයෙන් සිදු කළ බව වංශකථාගත විස්තරවලින් අනාවරණය වේ. මහ පැරකුම් රජු බුරුමය ආක්‍රමණය කිරීමට පෙලඹුණු හේතූන් අතර බුරුමයට ලංකාවෙන් යවන ලද සෑම වෙළෙඳ නැවකට ත්‍යාග වශයෙන් ඇතෙකු ලබා දීමේ සම්ප්‍රදාය බුරුම පාලකයා නැවැත්වීම, ලංකාවෙන් බුරුමයට ගෙන යන ලද ඇතුන්ගේ මිල ගණන් සීමා කිරීම, ලංකාවෙන් ගිය වෙළෙඳ දූතයන්ට හිරිහැර කොට ඔවුන් ගෙන ගිය පඬුරු සහ ඔවුන්ගේ නැව් කොල්ල කෑම ආදි ආර්ථික කරුණු කිහිපයක් හඳුනාගත හැකි ය (මහාවංශය සිංහල, 2004, පරි. 76, 14-35 ගාථා). එමෙන් ම ඔහු යටතේ දී ඇති වූ කෘෂිකාර්මික නවෝදය හේතුවෙන් මෙරටින් පිටරටට සහල් අපනයන කළ බැවින් ලංකාව තත්කාලීන ව 'පෙරදිග ධාන්‍යාගාරය' නමින් හැඳින්වූ බවට ජනප්‍රවාද පවතියි. මේ අනුව තත්යුගයේ දී සංවිධිත මෙන් ම පුළුල් ආර්ථිකයක් මෙරට පැවති බව පැහැදිලි ය. එහි දී රට තුළ සිදු වන දෛනික වාණිජ කටයුතුවල පහසුව වෙනුවෙන් සහ විස්තෘත වශයෙන් මෙන් ම ආංශුක වශයෙන් ද ආර්ථික කටයුතු ශක්තිමත් ව, කාර්යක්ෂම ව හා විධිමත් ව පවත්වා ගෙන යාම වෙනුවෙන් පරාක්‍රමබාහු රජු ඉහත ආකාරයට මස්ස කාසිවලට අමතර ව එහි අනුප්‍රභේද තුනක් ම නිකුත් කරන්නට ඇති බවට අනුමාන කළ හැකි ය. මේ අනුව පොලොන්නරු යුගයේ නිකුත් කර භාවිතයට ගන්නා ලද කාසිවල භාගය, කාල සහ අටෙන් එක ආදි වටිනාකම අනුව කුඩා ප්‍රමාණයේ කාසි භාවිත කර ඇත (ගුණරත්න, 2019, 28). එනම් කාසියේ භාවිත වටිනාකම අනුව විවිධත්වයක් මස්ස කාසිවල පවතයි. එහෙත් පොලොන්නරු යුගයේ දී සොළීන් විසින් නිකුත් කරන ලද ඔවුන්ගේ කාසිවල එවැනි විවිධත්වයක් හඳුනාගත නොහැකි වීම සොළී කාසි සහ මස්ස කාසි යන කාසි දෙවර්ගයේ ඇති තවත් අසමානතාවකි.

සොළීන් කාසි නිකුත් කිරීමේ දී ඉහත දැක්වූ පරිදි වටිනාකම අනුව විවිධත්වයක් අනුගමනය නොකළ ද කාසියේ ඇතුළත් සංකේත අනුව විවිධත්වයෙන් යුතු ව කාසි නිකුත් කිරීමට පෙලඹී තිබේ. ඔවුන් සිය කාසි බහුතරයක් නිකුත් කර තිබෙන්නේ අභිමුඛයේ හිට ගෙනත්, ප්‍රතිමුඛයෙහි හිඳ ගෙනත් සිටින මානව රුව දැක්වෙන කාසිවුවත් එම ස්වරූපයේ කාසි පමණක් ම නිකුත් කිරීමට ඔවුන් සීමා වී නැත. සොළීහු චේර, චෝල සහ පාණ්ඩ්‍ය රාජ්‍ය ලාංඡන දැක්වෙන කාසි ද නිකුත් කළහ. එයින් ඔවුන්ගේ දේශපාලන ජයග්‍රහණයන් ප්‍රකට කෙරෙන බවට සැලකේ. රාජේන්ද්‍ර චෝල රජුට අයත් එක් කාසියක මුහුණත වියනක් යට කොටියෙකු හිඳ ගෙන සිටින විලාසයත් ඊට ඉදිරියෙන් මත්ස්‍යයන් දෙදෙනෙකුගේ රුවත් දැක්වේ. එහි ප්‍රතිමුඛයෙහි දුන්නක් දැක්වෙන අතර නාගරී අක්ෂරයෙන් පේළි දෙකකට 'ගංගෛකොණ්ඩ චෝල' යනුවෙන් සටහන් කර ඇත (Sirisena, 2002, 14). රාජේන්ද්‍ර රාජ රජුගේ කාසි වර්ගයක චේර, චෝල, පාණ්ඩ්‍ය යන එකල දකුණු ඉන්දියාවේ බලවත් ව පැවති රාජධානි ත්‍රයයේයේ රාජකීය සංකේත වන පිළිවෙළින් ඊතලය, කොටියා, මත්ස්‍යයා යන සංකේත ත්‍රයය නිරූපණය කර තිබේ. මේ අනුව අභිමුඛයේ හිට ගෙනත්, ප්‍රතිමුඛයෙහි හිඳ ගෙනත් සිටින මානව හෝ නිධි රුව දැක්වෙන කාසිවලට අමතර ව වෙනත් රූප නිරූපිත කාසි ද සොළීන් විසින් නිකුත් කර තිබෙන බවට පැහැදිලි ය. පොලොන්නරුවේ මස්ස කාසිවල මෙවැනි අන්තර්ගත සංකේතවල වෙනස්කමක්

හඳුනාගත නොහැකි ය. ඒවායෙන් ඒකාකාරී බවක් විද්‍යමාන වේ. අභිමුඛයේ හිට ගෙන සිටින මානව රුවත්, එය හිඳි ඉරියව්වෙන් යුතු ව ප්‍රතිමුඛයෙහිත් කේන්ද්‍රීය සංකේතය ලෙස නිරූපිත කාසි පමණක් මෙරටින් පොලොන්නරු යුගයේ දී හඳුනාගත හැකි ය. මහා විජයබාහුගේ පටන් දඹදෙණියේ පළමු වන බුවනෙකබාහු රජු දවස දක්වා ම සිටි රජවරුන් සිය නම පමණක් වෙනස් කරමින් ඒකාකාර ස්වරූපයෙන් කාසි නිකුත් කර ඇත. මේ අනුව කාසිවල අන්තර්ගත සංකේත පදනම් කර ගනමින් විවිධත්වයෙන් යුතු කාසි නිකුත් කිරීමක් සොළීන් ගෙන් හඳුනාගත හැකි අතර පොලොන්නරු පාලකයන්ගෙන් එවැන්නක් හඳුනාගත නොහැකි වීම ද සොළී කාසි සහ මස්ස කාසි අතර පවතින අසමානතාවකි.

වගු අංක 03 - මස්ස කාසියේ අනුප්‍රභේද නිකුත් කර ඇති පාලකයෝ

| නිකුත් කළ පාලකයා | මස්ස කාසි | අඩ මස්ස කාසි (1/2) | 1/8 කාසි | 1/16 කාසි |
|---|---|---|---|---|
| මහා විජයබාහු (ක්‍රි. ව. 1055-1110) | ✓ | | | |
| මහා පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) | ✓ | ✓ | ✓ | ✓ |
| නිශ්ශංකමල්ල (ක්‍රි. ව. 1187-1196) | ✓ | | | |
| චෝඩගංග (ක්‍රි. ව. 1196-1197) | ✓ | | | |
| ලීලාවතී (ක්‍රි. ව. 1197-1200, ක්‍රි. ව. 1209-1210, ක්‍රි. ව. 1211-1212) | ✓ | ✓ | | |
| සහස්සමල්ල (ක්‍රි. ව. 1200-1202) | ✓ | ✓ | | |
| ධර්මාශෝකදේව (ක්‍රි. ව. 1208) | ✓ | | ✓ | |

මූලාශ්‍රයඃ ද සිල්වා, 2018, 45.

සොළී කාසි සහ මස්ස කාසි අතර බර ප්‍රමාණයන්ගේ වෙනස්කම් ද හඳුනාගත හැකි ය. මේ පිළිබඳ ව කොඩ්රින්ටන්ගේ "Ceylon Coins & Currency" කෘතියෙහි විශ්ලේෂණයක් අන්තර්ගත වේ (Codrington, 1924, 73). එහෙත් බරෙහි පවතිනි අඩු-වැඩි වීම් මෙම කාසි දෙවර්ගය අතර පවතින ප්‍රධාන අසමානකමක් ලෙස දැක්වීමට අසීරු ය. මන්ද කාසි සංසරණය වීමේ දී ගෙවී යන අතර එමගින් නිරායාසයෙන් ම බරෙහි වෙනසක් ඇති වේ. මීට අමතර ව හායනකාරකයන්ගේ බලපෑම් නිසා ද කාසිවල බරෙහි වෙනස්කම් සිදු වේ. මේ හේතුවෙන් කාසිවල බර පදනම් කර ගෙන සොළී කාසි සහ මස්ස කාසි අතර අසමානතාවක් හඳුනාගැනීමට උත්සාහ කිරීම යුක්ති සහගත නොවනු ඇත.

මස්ස කාසිවල තිත් රාමුවක් දැකගත හැකි ය. ඒ අනුව අභිමුඛයෙහි සහ ප්‍රතිමුඛයෙහි දැක්වෙන කේන්ද්‍රීය මානව රුව, අනෙකුත් අප්‍රධාන සලකුණු සහ රජුගේ නාමය මැදි වන පරිදි තිත් රාමුවක් කාසිය වටා නිරූපණය කර තිබේ. මෙම තිත් රාමුව අඩ මස්ස, 1/8 සහ 1/16 යන අනුප්‍රභේදයේ කාසිවල ද දැකගත හැකි ය. ඒ ආකාරයට සියලු සංකේත මැදි වන සේ දක්වා ඇති තිත් රාමුවක් සොළී කාසිවල දැකගත නොහැකි ය. එය ද මෙම කාසි දෙවර්ගය අතර දැකිය හැකි අසමානතාවකි. මෙම තිත් රාමුව ඇතැම් මස්ස කාසිවල එක් පසෙක පමණක් දැක්වේ. අඛණ්ඩ ව වෘත්තාකාර ව කාසිය වටා දිව ගොස් තිබෙනු හඳුනාගත නොහැකි ය. එසේ සිදු ව තිබෙන්නේ කාසි අච්චු ගැසීමේ දී සිදු ව ඇති තාක්ෂණික දෝෂයක් නිසා විය යුතු ය.

සොළී කාසිවල සහ මස්ස කාසිවල දැක්වෙන අභිමුඛයේ හිට ගෙනත්, ප්‍රතිමුඛයෙහි හිඳ ගෙනත් සිටින කේන්ද්‍රීය මානව හෝ නිධි රුව නිරූපණය කර තිබීම අනුව ද මේ කාසි දෙවර්ගයෙහි අසමානතාවක් හඳුනාගත හැකි ය. එනම් එම කේන්ද්‍රීය මානව හෝ නිධි රූපයෙහි මුහුණ නිරූපණය කර තිබීමේ පැහැදිලි වෙනසක් මේ කාසි දෙවර්ගයෙහි දැකගත හැකි ය. සොළී කාසිවල කේන්ද්‍රීය මානව හෝ නිධි රූපයෙහි ඇස, නාසය, මුඛය ආදි මුහුණේ අංග පැහැදිලි ව හඳුනාගත හැකි අයුරෙන් නිරූපිත ය. තව ද හිසෙහි පැලඳි හිස් අවාරණය ද පැහැදිලි ව නිරූපණය කර තිබේ. එහෙත් පොලොන්නරු යුගයේ නිකුත් කර ඇති මස්ස කාසිවල කේන්ද්‍රීය මානව හෝ නිධි රුවේ මුහුණ කල් යත් ම සරල රේඛා භාවිතයෙන් ඉංග්‍රීසි හෝඩියේ "E" අක්ෂරයේ ස්වරූපයට නිරූපණය කර තිබේ. මුහුණේ අංග පැහැදිලි ව නිරූපණය කර නොමැත. කාසි මුද්‍රණය කළ අයගේ දැනීම අඩුකම නිසා එසේ සිදු වන්නට ඇති බවට මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියෝ පවසති (විමලකිත්ති හිමි, 1969, 21). මේ සඳහා ලෝහයේ පිරිහීම ද හේතු වන්නට ඇත. 12 වන සියවසේ සිට ඉදිරියට ක්‍රමයෙන් බාල වූ බව සහ මෝස්තරය සහ කාසි සම්පාදනය පිරිහුණු බව නිරීක්ෂණය කළ හැකි බවට ජී. පී. එස්. එච්. ද සිල්වා පවසයි (ද සිල්වා, 2018, 44). බාල ලෝහවලින් කාසි නිකුත් කිරීමේ පාලකයාගේ අරමුණ පිළිබඳ ව පරණවිතානගේ පහත විස්තරයෙන් හඳුනාගත හැකි ය.

"මේ බාල කාසි නිකුත් කළ රජවරුන් ඒවා පාවිච්චි කිරීමට බල කිරීම නිසා රටවැසියන්ට අලාභයක් සිදු වුවත් ඒ රජවරුන්ට නම් විශාල ලාභයක් ලැබෙන්නට ඇත. බාල ලෝහ කාසිය වැඩිවැඩියෙන් නිකුත් කළ තරමට රටවැසියන්ගේ ධනය වැඩිවැඩියෙන් උදුරා ගැනීමට රජුට පුළුවන් වූ බව පෙනේ." (පරණවිතාන, 1972, 525).

මේ අනුව බාල ලෝහ භාවිතය නිසා කාසියේ බාහිර ස්වරූපයට හානි වීම පමණක් නො ව සමාජ-ආර්ථික වශයෙන් ද පිරිහීමක් සිදු වූ බවට පැහැදිලි ය.

## සමාලෝචනය

ශ්‍රී ලංකාවේ කාසි ව්‍යවහාරය හස් එබූ කාසිවලින් ආරම්භ වී අනුරාධපුර රාජධානි සමයේ අවසාන අවධිය වන විට රන්කහවණුව සංසරණය වීම දක්වා විකාශනයට

පත්වන්නේ ය. අනුරාධපුරයෙන් පසු ව අගනගරය පොළොන්නරුවට මාරු වේ. ඒ අනුරාධපුර රාජධානියට එල්ල වන සොළී ආක්‍රමණය හේතුවෙනි. පස් වන මිහිඳු රජ දවස මෙරට ඇති වන ආභ්‍යන්තරික අර්බුදකාරී තත්ත්වය පාදක කර ගෙන පළමු වන රාජ රාජ චෝල රජු ක්‍රි. ව. 993 දී ද ඔහුගේ පුත් පළමු වන රාජේන්ද්‍ර චෝල රජු ක්‍රි. ව. 1017 දී ද අනුරාධපුරය ආක්‍රමණය කොට චෝල අධිරාජ්‍යයෙහි අවසන් ප්‍රාන්තය ලෙසට ලංකාවේ රජරට කලාපය නතු කර ගනිති. පළමු වන රාජ රාජ රජුගේ විරුද නාමයකට අනුව 'මුම්මඩිචෝල මණ්ඩලම්' යනුවෙන් සොළීහු තත්කාලීන ව ලංකාව හැඳින්වූහ. සිය අගනුවර ලෙස පොළොන්නරුව තෝරාගත් සොළීහු පළමු වන රාජේන්ද්‍ර චෝල රජුගේ විරුද නාමයකට අනුව 'ජනනාථපුරම්' යනුවෙන් පොළොන්නරුව නම් කොට ස්වකීය ප්‍රතිරාජයෙකු යටතේ පාලනය කළහ. මේ අනුව පොළොන්නරුව මුලින් ම අගනගරය ලෙස තෝරා ගනු ලැබුවේ සොළීන් විසිනි.

රන් කහවණුව සහ මස්ස අනුරාධපුර යුගයේ අග භාගයේ සිට පොළොන්නරු යුගය අවසන් වන තෙක් මෙරට තුළ විනිමය මාධ්‍යය ලෙසින් සංසරණය වූ කාසි වර්ග ලෙස හඳුනාගත හැකි ය. මස්ස කාසිය නිර්මිත ලෝහ මාධ්‍යය අනුව රන් මස්ස, රිදී මස්ස, තඹ මස්ස සහ රිදී ආලේපිත තඹ මස්ස යනුවෙන් විවිධත්වයට වේ. එමෙන් ම රන් කහවණුවේ මෙන් ම මස්ස කාසිවල ද වටිනාකම අනුව වෙනස් වන අනුප්‍රභේද නිකුත් කිරීමක් ද හඳුනාගත හැකි ය. ඒ අනුව පොළොන්නරු යුගයේ නිකුත් කර තිබෙන මස්ස කාසි අඩ මස්ස, 1/8 සහ 1/16 යනුවෙන් ද වටිනාකමෙන් විවිධත්වයට පත් වේ. පොළොන්නරු යුගයේ නිකුත් කරන ලද මස්ස කාසිය ප්‍රසිද්ධ ව තිබෙන්නේ දඹදෙණි මස්ස යනුවෙනි (ගුණරත්න, 2019, 27). ඒ අවසන් වරට එම කාසි අච්චු ගැසීම සිදු කරන ලද්දේ දඹදෙණි යුගයේ දී බැවිනි (කල්දේරා, 1959, 18). පොළොන්නරු යුගයේ පළමු කාලවකවානුව අයත් වන්නේ සොළී යුගයට ය. ඒ අනුව ක්‍රි. ව. 1070 දක්වා කාලය මීට අයත් වේ. චෝලයන් ඒ වන විට මෙරට තුළ ප්‍රචලිත ව පැවති කහවණුව අනුගමනය කර ඊට ඔවුන්ගේ නම් යොදා භාවිතයට ගෙන තිබේ (ද සිල්වා, 2018, 41). ඒ අනුව පළමු වන රාජ රාජ රජු ඒ අකාරයට තම නම යොදා කහවණුවේ ස්වරූපයට සමාන ව රන් හා තඹ කාසි අච්චු ගසා භාවිතය නීතිගත කර තිබේ. ඔහුගේ කාසි කහවණුවෙන් වෙනස් වූයේ කහවණුවේ ඇති "ශ්‍රී ලංකා විභූ" යන පාඨය වෙනුවට 'ශ්‍රී රාජ රාජ' යනුවෙන් යොදා තිබීමෙනි (විමලකිත්ති හිමි, 1969, 24). සොළීන් ගෙන් රට මුදවා ගන්නේ මහා විජයබාහු රජු ය. ඔහු ද කාසි නිකුත් කිරීමේ දී සොළීන් අනුගමනය කළ නිසා රජවරුන් තම නම සහිත ව කාසි නිකුත් කිරීමේ සම්ප්‍රදායක් (ද සිල්වා, 2018, 41) පොළොන්නරු යුගයේ දී ඇති විය. මේ අනුව පොළොන්නරු යුගයේ භාවිත කාසිවල ඒකාකාරී ස්වරූපයක් පවතින බවට කිව හැකි ය. කාසි නිර්මිත මාධ්‍යය, කාසිවල ඇතුළත් සංකේත සහ වටිනාකම අනුව සුළු වශයෙන් සමානතා සහ අසමානතා සොළී කාසිවල සහ මස්ස කාසිවල පවතින බවට හඳුනාගත හැකි ය. මේ පිළිබඳ ව ඉහත විස්තරාත්මක ව තොරතුරු සාකච්ඡා කොට තිබේ. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ කාසි සම්මත බරක්, හැඩයක් සහ නිශ්චිත වටිනාකමක් මෙන් ම නිකුත් කළ පාලක අනන්‍යතාව (පාලක නාමය) සහිත ව නිකුත් කිරීමේ සම්ප්‍රදාය 12 වන සියවස වන විට ඇති වීම වැදගත් වේ (බාලසූරිය, 2008, 7). එම සම්ප්‍රදාය ඇති වීම කෙරෙහි සොළී පාලනයෙන් ද

බලපෑම් වුවාට සැක නැත. මන්ද සොළීන් සාමුද්‍රික අධිරාජ්‍යයක් ගොඩනඟා ගැනීම හරහා අන්තර්ජාතික වෙළෙඳාමට නැඹුරු වූ පිරිසක් වන බැවිනි. අන්තර්ජාතික වෙළෙඳාමේ දී විනිමය මාධ්‍යයට ප්‍රමුඛතාවක් හිමි වේ. පොලොන්නරු යුගයේ දී කාසි නිකුත් කිරීමේ දී මේ තත්ත්වය කෙරෙහි පොලොන්නරු පාලකයන් ද විමසිලිමත් වන්නට ඇත. පොලොන්නරු යුගයට අයත් කාසි අප්‍රිකාවේ නැගෙනහිර වෙරළ තීරය දක්වා ම ව්‍යාප්ත වී තිබේ (Imbulamure and others, 2016, 17). මේ අනුව දේශීය පාලකයාට ද කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථික ක්‍රමයෙන් වෙළෙඳාම පදනම් කර ගත් ආර්ථිකයකට පරිවර්තනය වී අන්තර්ජාතික වෙළෙඳාමට යොමු වීමට සිදු වූ බව පෙනේ. සොළීන්ගේ සිට දඹදෙණි යුගයේ පළමු වන බුවනෙකබාහු රජු දවස දක්වා ම පාලක නාමය පමණක් වෙනස් ව මස්ස කාසි ඒකාකාරී ස්වරූපයක් ගනු ලබන්නේ මේ අන්තර්ජාතික පිළිගැනීම මස්ස කාසි කෙරේ පවත්වා ගැනීමට උනන්දු වූ නිසා විය යුතු ය. කෙසේ වුවත් පුරාණ ලංකා සමාජය තුළ දීර්ඝ කාලයක් විනිමය මාධ්‍යයක් ලෙස අඛණ්ඩ ව භාවිත වූ කාසි වර්ගය වන්නේ මස්ස කාසි ය. එබැවින් මස්ස කාසි ඓතිහාසික වශයෙන් සුවිශේෂ වැදගත්කමක් උසුලයි. මස්ස කාසි නිකුත් කිරීමට මෙන් ම මස්ස කාසිවල දීර්ඝ කාලීන අඛණ්ඩ භාවිතයටත් සොළී කාසිවලින් මෙන් ම සොළී පාලනයෙන් ද ආභාසය ලැබී තිබෙන බව පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කල්දේරා, ලීලානන්ද. (1959). **ලංකාවේ මිල මුදල්**. කොළඹ: කොළඹ ජාතික කෞතුකාගාරය.

කුලතුංග, ටී.ජී. (2015). **ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය**. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

ගුණරත්න, ජී. ධම්මික. (2019). **කාසියේ අසිරිය**. කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

ජයසිංහ, කරුණාරත්න. (2013). **ශ්‍රී ලංකාවේ පුරාණ මුදල් සහ වෙළඳ ගනුදෙනු**. මීරිගම: ආශිර්වාද ප්‍රකාශන.

තාපර්, රොමිලා. (2009). **ඉන්දියාවේ ඉතිහාසය**. පරි. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. පිටකෝට්ටේ: සිසාරා ප්‍රින්ට්වේව් ප්‍රයිවට් ලිමිටඩ්.

දන්දුන්න, මනිල. (2015). **ලංකාවේ පැරණි කාසි**. කළුතර: ReadMe (Pvt) Limited.

ද සිල්වා, ජී. පී. එස්. එච්. (2018). **ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ක්‍රමයේ ඉතිහාසය**. පරි. නිමල් ලාලිත රත්නසේකර. බොරගැස්ගමුව: කතෘ ප්‍රකාශනයකි.

නීලකණ්ඨ ශාස්ත්‍රී, කේ. ඒ. (1972). "ලංකාවේ චෝළ අධිරාජ්‍යයේ ප්‍රදේශයක් ව පැවති කාලය". හේම් චන්ද්‍ර රාය (සංස්.), **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය ෧෦෨ භාගය**. කැලණිය: විද්‍යාලංකාර විශ්විද්‍යාලය.

පරණවිතාන, ඇස්. (1972). "පොළොන්නරු යුගයේ සභ්‍යත්වය: දේශපාලන, අර්ථ හා සමාජ තත්ව". හේම් චන්ද්‍ර රාය (සංස්.), **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය භාගය**. කැලණිය: විද්‍යාලංකාර විශ්විද්‍යාලය.

බාලසූරිය, ඉනෝකා. (2008). **පැරණි මුදල්**. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

**මහාවංශය සිංහල**. (2004). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්.), දෙහිවල: අජිත් ප්‍රින්ටර්ස්.

මැදගම, හේරත් බණ්ඩාර කේ.එම්. (2009). **ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් නෝට්ටුවල ඉතිහාසය සහ සන්නිවේදන ලක්ෂණ**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, සිරිමා. (1972). "පළමු වැනි පරාක්‍රමබාහු රජුගේ අනන්තරාගාමිකයෝ: පොළොන්නරුව රාජධානියේ බිඳ වැටීම". හේම් චන්ද්‍ර රාය (සංස්.), **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය [illegible] භාගය**. කැලණිය: විද්‍යාලංකාර විශ්විද්‍යාලය.

විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ. (1969). **ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය**. කොළඹ: සුමන මුද්‍රණාලය.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2014). **රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි**. කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

Codrington, H.W. (1924). **Ceylon Coins & Currency**. Colombo: A.C. Richards Acting Government Printer.

Imbulamure, Sarath and others. (2016). **Modernization and Expansion of the Bank of Ceylon Museum**. Colombo: Bank of Ceylon Money and Banking Museum.

Sirisena, O.M.R. (2002). **Medieval Gold Coins of Sri Lanka**. Colombo: Unigraphics (Pvt) Ltd.